07/08/2011 - ඉරිදා ලංකාදීප

**ඉන්දු - චීන ආර්ථික සහයෝගීතාවයට ශ්‍රී ලංකාවේ යාන්ත්‍රණයක් - මිලින්ද මොරගොඩ**

ගැටුම් සහිතව ජීවත් වූ අම්හිරි යුගය අවසන්වීමත් සමග රට තුළ අලුත් ආර්ථිකයක් බිහිවෙමින් තිබේ. එය මැදියම අන්ධකාර පහවී අරුණාලෝකය උදා වීමකි. අරුණ උදාවන අවස්ථාව අලුත් අත්දැකීම් සොයා යා යුතු සමයකි. දවස උදා වී ජීවිතය ගත කරන්නට පහසුකම් සපයන තුරු ලතැවීමට වඩා එය සොයා යාමට තීන්දු කිරීම වැදගත්ය. එයට පදනම විය යුත්තේ අපේ අත්දැකීම්ය. යටත් වන්නට පෙර සිටම ලංකාව ප්‍රකටව පැවතියේ වෙළඳාමටය. සේද මාවත ඔස්සේ මෙරටට පැමිණි වෙළඳුන් ගැන ඉතිහාසයේ සඳහන්ය. මන්නාරම ත්‍රිකුණාමලය ප්‍රසිද්ධව තිබී ඇත්තේ නැව් තොටමුණු වශයෙනි. මෙරටින් කුළුබඩු, මුතු මැණික් හා මුතු ගෙනයාමට විදේශ වෙළඳුන් නිතර පැමිණ තිබේ. බටහිර ප්‍රජාව පවා රටට පැමිණියේ වෙළඳ සමාගම් වශයෙනි. රටේ ඇති සාරවත්බව හෙයින් පසුව හමුදා මෙහෙයවා යටත් කර ගන්නට අධිරාජ්‍යවාදීහු පෙළඹුනහ. වෙළඳාම හා ඒ සම්බන්ධ අත්දැකීම් රටට ඇත්තේ අනාදිමත් කාලයක පටන්ය. මෙරට ව්‍යවසායකයන් සිටියහ. වෙළඳ ද්‍රව්‍ය හුවමාරු කර ගත්හ. බටහිර ජාතිකයන් ලංකාවේ වෙළඳාම තමන් සතු කර ගත්තා පමණක් නොව තම රටට අවශ්‍ය වෙළඳ ද්‍රව්‍ය වශයෙන් කෝපි, තේ, කුරුඳු හා රබර් වවන්නටත් ඒවා තම රටවලට ගෙනයාමේ ව්‍යාපාර මෙහෙයවන්නට වූහ. තවමත් බටහිරට අවශ්‍ය ඇඟලුම්, තේ හා රබර් නිර්යාථ කරමින් ඒ මත යැපෙමින් සිටින අතර ආසියාවේ දියුණු වූ රටවල්, ඉලෙක්ට්‍රොනික්, පරිගණක යුගවලින් අනතුරුව සේවා ආර්ථිකයට ද ඇතුලු වෙමින් සිටී. යුද්ධය හා නිසි අවස්ථාවේ තීන්දු ගැනීමට නොහැකිවීම නිසා ලංකාව තවමත් සිටින්නේ ආසියාවට පිටුපසින්ය.

ජාත්‍යන්තර සමාජය චීනය හා ඉන්දියාව දකින්නේ අවදිවන යෝධයන් හැටියටය. විශාල ජනගහනය හා ඒ වෙනුවෙන් ඇති අති විශාලවෙළඳ පොළ මෙහි අවස්ථාවයි. බලවත් රටවල් ඉන්දියාව හා චීනය සමග විවිධ අන්දමට අලුත් සබඳතා ඇති කර ගන්නා මං සොයයි. ජාත්‍යන්තර ව්‍යාපාරිකයන් අනාගතය දකින අන්දමට ඉන්දියාව හා චීනය ආසියාවේ වැදගත් කේන්ද්‍රස්ථානයන්ය.

ඉන්දියාව හා චීනය ශ්‍රී ලංකාවේ ආර්ථිකයට සම්බන්ධ කරගත යුතුව ඇති අවස්ථා ගැන ගැඹුරින් අධ්‍යයනය කිරීම අවශ්‍යය. ජාත්‍යන්තර ප්‍රජාව ආර්ථික අර්බුදවලින් මිදී නව ප්‍රබෝධයකින් නැගී සිටී. ශ්‍රී ලංකාව දශක තුනකට වැඩි කාලයක් පැවති අභ්‍යන්තර සිවිල් යුද්ධය අවසන්කර අලුත් යුගයකට ප්‍රවේශවන මොහොතයි. මේ නිසා මෙවැනි අලුත් පැති ගැන සංවාදයක් රටට වැදගත්ය.

1950 අග භාගයේ ශ්‍රී ලංකාව සමෘද්ධිමත් ආර්ථික තත්ත්වයක පසුවිය. නිදහස ලැබීමෙන් පසු ගත වූ පළමු වසර දහය තුළ තේ රබර් පොල් යන අපයනය කෘෂි භෝග වලින් හා වී වගාව රට තුළ හා රටේ විනිමය තත්ත්වය සතුටුදායක මට්ටමකට ගෙන ආවේය.මෙම කාලය තුළ රටේ ආර්ථිකය ප්‍රගතිය කරා යොමු කරන ව්‍යුහාත්මක වෙනස්කම් ඇති කිරීමට බලධාරීහු අපොහොසත් විය. මැලේරියාව ඇතුලු සෞඛ්‍ය ප්‍රශ්න මතුවීම හා නිදහස ලැබීම සමග උදා වූ වාතාවරණය අනුව ආර්ථිකය නිසි මගට අවතීර්ණ වූයේ නැත. 1970 දශකයේ මැද වන විට ආයෝජන හීන වූ අතර විරැකියාව ඉහළ ගියේය. ආර්ථිකයේ සම්පූර්ණයෙන් රජයේ පාලනයට යටත්ව පැවතින. 1977 ට පසු ආර්ථිකයේ ලිබරල් බවක් ඇති කරන ලද අතර ව්‍යුහාත්මක වෙනස්කම් ගණනාවක් සිදුවිය. මෙම ප්‍රතිසංස්කරණ 1981-91 හා 2001-02 වකවානු වලදී ද නැවත නැවතත් සිදුවිය. එයින් ආර්ථිකයේ වර්ධනයක් ඇතිවිය. එය කොතරම් ද යත් 1971-77 කාලයේ සාමාන්‍යයෙන් පැවති සියයට 2.9 ක වර්ධනය සියයට 5 ඉක්මවන ලද අතර කෙසේ වුවත් ලිබරල් ආර්ථිකයේ නැග්ම පැවති සිවිල් ගැටුම් අවසන් වීම සමග වඩාත් ස්ථාවර අන්දමට පැතිරිය යුතුව තිබේ.

ආර්ථිකයේ නිසි අවස්ථාවේ දී සිදුවිය යුතු වෙනස්කම් හා සිවිල් ගැටුම් ශ්‍රී ලංකාවේ සමෘද්ධියට හා ආර්ථිකයේ දුර්වල ක්‍රියාකාරිත්වයට හේතු විය. දකුණු කොරියාව, සිංගප්පූරුව හා මැලේසියාව වැනි රටවලට වඩා ඉදිරියෙන් සිටිය යුතු ලංකාව මෙකී ඉරණම හෙයින් එකී රටවලට වඩා බොහෝ පිටුපසින් පසුවන බව නිරීක්ෂණය කළ හැකිය. දැන් අතීතයේ පැවති අවාසනාවන්ත තත්ත්ව නැත. හැම අතකින්ම වාසිදායක පසුබිමක සිටින ලංකාවට ලෝක ආර්ථික දියුණුව ශක්තියක් කර ගනිමින් දියුණුව කරා ලඟා වීමට අවකාශ උදා වී තිබේ.

රජය සියයට 8-10 අතර සංවර්ධන වේගයක් පවත්වාගෙන යාම ඉලක්ක කර තිබේ. මෙම සංවර්ධනය ස්ථාවර මට්ටමකින් පවත්වාගෙන යන්නට දේශීය හා විදේශීය ආයෝජන දැනට පවතින මට්ටමට වඩා වැඩි කළ යුතුය. දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් වහයෙන් සියයට 21 ක පවතින මෙරට ආයෝජන සියයට 28 දක්වා වැඩි කිරීම අවශ්‍යය. රජයේ ආයෝජන දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් වශයෙන් සියයට 6-7 අතර පවත්වාගෙන යාමට කැපවන බව පෙනේ. පුද්ගලික අංශයේ ආයෝජන නංවා ගැනීමට නම් ප්‍රමාණවත් අන්දමට අපනයන ඉහළයාම අවශ්‍ය සාධකයකි. දේශීය වෙළඳ පොළේ ඉල්ලුම හා එහි විශාලත්වය ද ආර්ථික වර්ධන ඉලක්ක සපුරා ගැනීමේ දී සලකා බැලිය යුතුය.

එහිලා බටහිර සිට නැගෙනහිර දක්වා පුළුල් පරාසයක විහිදෙන ආර්ථික කේන්ද්‍රයක් බවට ශ්‍රී ලංකාවේ ක්‍රියාකාරීත්වය හැරවීම අවශ්‍ය. එවැනි වෙනසකට ගමන් කිරීම උදෙසා ප්‍රධාන අවස්ථා දෙකක් අපට ඇත. එයින් පළමු වැන්න රටට කිට්ටුවෙන් ඇති ඉන්දියාවේ වේගයෙන් වර්ධනය වන ආර්ථිකයයි. දෙවැන්න චීන ශ්‍රී ලංකා රබර් සහල් ගිවිසුමේ සිට මෑත භාගයේ විශිෂ්ට සම්බන්ධතා ඇති චීන ආර්ථිකයයි.

වර්තමානයේ මෙරට අපනයන වලින් සියයට හැටක් යැවෙන්නේ යුරෝපීය හා උතුරු ඇමරිකානු වෙළඳ පොළටය. ඉන්දියාව, චීනය හා ජපානය වැනි නැගෙනහිර කලාපයේ රටවලට යැවෙන අපනයන ප්‍රමාණය මෙරට මුළු අපනයන වලින් සියයට දහයකට අඩුය. දකුණු හා නැගෙනහිර ආසියානු රටවලට අපනයන වෙළඳ පොළ සකස්කර ගැනීම මෙරට ට අවශ්‍යය. මෙම රටවලට නිමි ද්‍රව්‍ය අපනයනය අතිශය තරඟකාරී එකකි. එහෙයින් අප රට ට අවස්ථාව ඇත්තේ මෙම අපනයන වෙළඳ පොළට යම් සැපයුම් සම්බන්ධතාවක් ගොඩනගා ගැනීමයි. ආසියාවේ රටවල් අතර අන්තර් ආයතන වෙළඳාම ජාත්‍යන්තර වෙළඳ පොළට ප්‍රවේශ වීමේ දී කදිම අවස්ථාවක් බව පෙනේ. රටවල් කිහිපයක් එකතු වී නිෂ්පාදනය කර වෙළඳාමට භාණ්ඩ අපනයනය අද රටාවයි. එය මෙරට නිපදවීමට වඩා දේශ සීමා අතර භාණ්ඩ අළෙවියට සේවා පහසුකම් සපයන අලුත් සංකල්පයකි. ශ්‍රී ලංකාව දැනට එවැනි අංශ කෙරෙහි සැලකිලිමත් වී නැති අතර ආසියාවේ විශාල නිෂ්පාදකයන් හා සම්බන්ධ වී ඇත්තේ ඉතාම අල්ප වශයෙනි.

ඉන්දියාවට සැතපුම් විස්සක් පමණ එකිනෙකට දුරින් පිහිටි අපට ඉතා වේගයෙන් වර්ධනය වන චීන හා ඉන්දියානු ආර්ථිකයේ වෙළඳ පොළ සැපයුම් ජාලයට බද්ධ විය හැකිය. ජපානය හා ඉන් පසුව චීනය වේගයෙන් දියුණු වූයේ බටහිරට හා නැගෙනහිර ආසියානු රටවල සම්බන්ධවීම සමගය. අන්තර් වෙළඳාම හා සැපයුම් ජාල සම්බන්ධතා එකී සාර්ථකත්වයේ රහස බව පෙනේ. ශ්‍රී ලංකාවට ද ඉන්දියාවේ සංවර්ධනය වේගවත් වන විට මුලින් කී රටවල් අනුගමනය කළ ප්‍රතිපත්ති අනුව ක්‍රියාකිරීමෙන් නිසි පසුබිමක් සකස් කර ගැනීමට හැකියාව ඇත. ලංකාව එහි ඇති ආර්ථික විභවයෙන් ප්‍රයෝජන ගන්නට උත්සාහ නොගන්නේ මන්ද?. තමන්ට වඩා භූගෝලීය වශයෙන් විශාල, ජනගහනය අතින් වැඩි ඉන්දියාව, යෝධයෙකු ලෙස හා ඒ යෝධයා විසින් යටපත් කරගන්නට නිතර වෑයම් කරන ලංකාව ලෙස සිතන්නට අපි හුරුවී සිටින්නෙමු. එය අසාමාන්‍ය භීතියකි. එපමණක් නොවේ ඉන්දියන් විරෝධයක් පවත්වාගෙන යන්නටත් ඒ විරෝධය පෙන්වා මහජනතාව ට ඇත්ත සඟවන්නටත් අපි සමත්ව සිටිමු.

ඉන්දියාව සියයට අට ඉක්මවන ආර්ථික වර්ධනයක් පෙන්වන අතර අන්ද්‍රා ප්‍රදේශය, කර්නාටක, කෝරළ හා තමිල්නාඩු යන ප්‍රාන්ත ඉලක්කම් දෙකකින් දැක්වෙන සංවර්ධන වේගයක් පවත්වාගනිමින් සිටියි. කෘෂි අංශයේ දියුණුව අඩු අතර කාර්මික නිෂ්පාදන අංශ හොඳ ප්‍රගතියක් පෙන්වයි. එයින් අනාවරණය වන්නේ මිලියන දෙසිය පනහකට වැඩි මධ්‍යම පාන්තික ජනගහනයක් අලුතින් බිහිවන බවය. ශ්‍රී ලංකාවට හා මෙරට සමාගම් වලට අභියෝගය වී ඇත්තේ මෙම දියුණු වෙමින් පවතින වෙළඳ පොළ සැපයුම් ජාලයට ඇතුළු වීමයි. විශේෂයෙන් ඉන්දියාවේ දකුණු කලාපයට සම්බන්ධවීමයි. ජපානයේ සමාගම් 270 ක් පමණ තමිල්නාඩුවේ පමණක් පවත්වාගෙන යයි. ශ්‍රී ලංකේය සමාගම්වලට කාර්යක්ෂමව හා තරඟකාරීව සැලසුම් කිරීමෙන් මෙම සැපයුම් ජාලයට හවුල් ව්‍යාපාර වශයෙන් අවතීර්ණ වන්නට හොඳ අවකාශයක් තිබේ. ඉන්දියාව ලෝක ආර්ථිකයේ කැපී

පෙනෙන භූමිකාවක් නියෝජනය කරන මෙම අවස්ථාවේ දී එවැනි මගක් තෝරා ගත හැකි නම් වැදගත්ය.

චීන සමාගම් මෙයට වසර කිහිපයකට කලින් විදේශ රටවල ආයෝජනය කර ව්‍යාපාර ඇරඹීමට උනන්දුවක් දැක්වීය. ඔවුන් වඩා ඇල්මක් දැක්වූයේ අප්‍රිකානු හා ලතින් ඇමරිකානු රටවල ස්වභාවික සම්පත් කෙරෙහිය. ඉතා මෑතක දී ඔවුන් බටහිර රටවල වෙළඳ පොළ වත්කම් කෙරෙහි අවධානයක් යොමු කර ඇත. 2010 වසරේ දී චීනය කළ සෘජු විදේශ ආයෝජනය ඇමරිකානු ඩොලර් බිලියන 250 ක් පමණ වන අතර ඉදිරි වසර දහය ඇතුලත එය ඇමරිකානු ඩොලර් ට්‍රිලියන එකේ සිට දෙක දක්වා වැඩිවන්නට ඉඩ ඇති බව සැලකේ. චීනය දැනටමත් ජපානය අනුගමනය කරන මග තෝරා ගනු ඇතැයි සැලකේ. 80 දශකයේ දී ජපානය යෙන් වටිනාකම නැවත තක්සේරු කළ අතර එය ආසියාවේ රටවල් අතර ඔවුන්ගේ වෙළඳාම ආයෝජන හා ව්‍යාපාර පැතිර යන්නට හේතුවක් විය.

චීනය මෙරටට වානිජ මට්ටමේ සැලකිය යුතු ණය මුදලක් ලබා දී තිබේ. මෙම ණය මගින මෙරට යටිතල පහසුකම් වැඩි දියුණු වෙමින් පවතී. යෝජිත ගැන්ගිලා හා සැටික් ආයෝජන ණය නොවන මෙරටට විදේශ සම්පත් හිමිවන විශාල අවස්ථාය. මෙය මෙවැනි තවත් ආයෝජන මෙරටට ආකර්ශනය කර ගැනීමට අවස්ථාවකි. චීන සමාගම් විදේශයන්හි ආයෝජනය කරන්නට දක්වන උනන්දුව අප රට දෙසට හරවා ගත යුතුය. මෙමගින් ඔවුන්ට දකුණු ආසියානු වෙළඳ පොළට ප්‍රවේශ වීමට ශ්‍රී ලංකාව මධ්‍යස්ථානයක් බවට පත්කර දිය හැකිය. මෙම න්‍යාය පත්‍රය සකස් කරන්නට ඉන්දියාව හා පකිස්තානය සමග අත්සන් කර ඇති නිදහස් වෙළඳ ගිවිසුම ආකර්ශණීය එකකි. චීනය ඉන්දියානු වෙළඳ පොළ වෙත අවධානය යොමු කරගෙන සිටින හා පකිස්තානය සමග ඔවුන්ගේ ඇති සුහද සම්බන්ධතා නිසා ශ්‍රී ලංකාවට මෙම දෙරට ට පහසුකම් සැලසීමේ අවස්ථාවක් නිර්මානය කරන්නට හැකියාව ඇත. එය ඉන්දියාව හා චීනය ආර්ථික අතින් සම්බන්ධ කිරීමට ශ්‍රී ලංකාව ප්‍රවේශ මාර්ගයක් බවට පත් කිරීමේ උපායකි.

ශ්‍රී ලංකාවේ ගමන කලින් සිට සැලසුම් වූයේ ඉන්දියාවට දොරටුවක් යන මූලික සංකල්පයේ පිහිටමිනි. එය ආර්ථික සැලැස්මකි. සීපා ආර්ථික සහයෝගීතාවය එහි එක් අවස්ථාවක් පමණකි. එහි ඇති පූර්ණ හවුල්කාර සම්බන්ධතාවය තහවුරු කර ගැනීම අවශ්‍යය. එය ඉන්දු - චීන සම්බන්ධතාවයට උදවුකරන දූත මෙහෙවරකි. ඉන්දියාව හා චීනය තම දෙරට අතර සම්බන්ධතා ඇති කර ගැනීමට හා වානිජ අවස්ථා වර්ධනය කර ගැනීමට උපාය කල්පනා කරන අතර පාරදෘෂ්‍ය භාවයකින් යුතු ප්‍රතිපත්ති මත සැලසුම් සකස් කළහොත් අපට හා මෙම රටවල් දෙකටම ජයග්‍රාහී අවස්ථා උදා කර ගැනීමට හැකියාව තිබේ. එය පහසු නැත. බරපතල අභියෝගයකි. රටවල් තුනටම ගැලපෙන ආර්ථික මූලධර්ම කෙරෙහි අවධානය යොමු කරන්නට සිදුවෙයි. මේ අනුව ශ්‍රී ලංකාව ඉන්දියාවට සැපයුම් දොරටුවක් වෙමින් ඉන්දු - චීන ආර්ථික සම්බන්ධතා ගොඩනගන්නට සාර්ථක වුවහොත් එය ආසියාවේ ආශ්චර්යය බවට පත්වීම වැළැක්විය නොහැකිය.

ඉන්දියාව හා ශ්‍රී ලංකාව අතර ආර්ථික සහයෝගීතාව විවිධ විද්වත් මත අනුව එම ඉලක්කගත මාර්ගය සකස් කරගැනීමත්, ඒ සඳහා න්‍යාය පත්‍රය අපට අනන්‍ය ලෙස සකස් කර ගැනීමටත් ලංකිකයන් ලෙස අපට හැකියාව තිබිය යුතුය. රටක දැවැන්ත හෝ කුඩා බව මේ අවශ්‍යතාවය සපුරා ගන්නට බාධාවක් නොවේ. එයට අවශ්‍ය නිසි දැක්මකි. ශ්‍රී ලාංකික දර්ශනයක් අනුව ඉන්දියානු ආර්ථික සහයෝගීතාවය හරහා චීනය සම්බන්ධ කරගන්නට නම් අපට වැඩ පිළිවෙලක් තිබිය යුතුය. ඕනෑම කාරණාවක යහපත හෝ අයහපත වශයෙන් පැති දෙකකි. යහපත ගැන නොසලකා අවාසිය හෝ භීතිය වැඩිකරන මත පැතිරවීමෙන් පමණක් සමාජයක් ඉදිරියට ගමන් නොකරයි. මේ පිටුපසින් සිටින ආර්ථිකය ප්‍රසාරණය කළ හැක්කේ අලුත් අලුත් තීන්දු ගැනීමෙන් පමණකි. පැරණි ආර්ථිකයේ තමන්ට හිමිව තිබුණ කොටස ආරක්ෂා කරගැනීම වෙනුවෙන් අරගල කරනවාට වඩා තවත් ව්‍යාපාර හා කර්මාන්ත ඇති කර පොදු වෙළඳාමක් මගින් නව අවස්ථා බිහි කරගැනීම ගැන අවධානය යොමු කළ යුතුය.

ආර්ථිකයක් දියුණු වන්නේ ද තීන්දු ගැනීමෙනි. ලෝක ආර්ථිකය හැමදාමත් එක සේ පවතින්නේ නැත. විටින් විට වෙනස් වෙයි. අද පවතින අවස්ථාවන් ගැන තීන්දු ගැනීම පමාවීමෙන් සිදුවන හානිය ද

තක්සේරු කළ යුතුය. ධනය නිපදවන අවස්ථා බහුල කිරීම විනා ආර්ථික සමාජ සංවර්ධනයකට වෙනත් ඉඩක් නැත.